## 8 - ශ්‍රේණිය

## 6 - පාඩම

# සෞඛ්‍යවත් පාසල් පරිසරයක් ගොඩනගමු.

- සෞඛ්‍යය ප්‍රවර්ධන යනු,සෞඛ්‍යයට බලපාන සාධක තම පාලනයට ගැනීම මගින් තමාගේ සෞඛ්‍ය තත්වය දියුණු කර ගැනීමට පුද්ගලයන්ට හැකියාව ලබාදීමේ ක්‍රියාවලියයි.
- පාසල් පරිසරය භෞතික, මානසික හා සමාජීය පරිසරය ලෙස කොටස්වලට බෙදිය හැකිය.
- භෞතික පාසල් පරිසරයක පැවතිය යුතු අංග නම්,
    - පිරිසිදු වාතය



    - පිරිසිදු භූමිය



    - සෞඛ්‍යවත් ආපන ශාලාව
    - පන්ති කාමර පවිත්‍රතාව



- යහපත් මානසික හා සමාජීය පරිසරයක් යනු,ඔබ වටා සිටින පුද්ගලයන් සමග යහපත් සම්බන්ධතා පවත්වා ගනිමින් සතුටින් සිටිය හැකි පරිසරයකි.එහි පැවතිය යුතු අංග කිහිපයකි,
  - සුරක්ෂිත බව
  - උපදේශන පහසුකම්
  - සියල්ලන්ටම එකසේ සැලකීම
  - අගය කිරීම

- පාසල් සෞඛ්‍යය ප්‍රවර්ධනයට ගත යුතු ක්‍රියාමාර්ග කිහිපයකි,
  - සෞඛ්‍යවත් ප්‍රතිපත්ති සකස් කිරීම.
  - පුද්ගල නිපුණතා හා දැනුම සංවර්ධනය.
  - සෞඛ්‍යයට හිතකර පරිසරයක් ඇතිකිරීම.
  - ප්‍රජා දායකත්වය ලබා ගැනීම.
  - සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානය කිරීම හා ඒවායින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම.

- මෙම ක්‍රියාමාර්ග ඔස්සේ සෞඛ්‍යවත් පාසලක් ප්‍රවර්ධනය කිරීම සදහා ඔබට දායක විය හැකිය.

